හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


# ගොවිකටයුතු පුවත් හසුන


වෙළුම 45 2021 පළමු වන හා දෙවන කලාප ISSN 1991-040X








## කෘෂි ව්‍යාපාර කළමනාකරණයේ දී අලෙවි තොරතුරු භාවිතා කිරීම පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන

**හෙක්ටර්** කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය විසින් '*කෘෂි ව්‍යාපාර කළමනාකරණයේ දී අලෙවි තොරතුරු භාවිතා කිරීම*' පිළිබඳ දෙදින පුහුණු වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය.

බදුල්ල Capital City හෝටලයේ දී පසුගිය මාර්තු මස 29 සහ 30 යන දෙදින තුළ පැවැත්වූ මෙම පුහුණු වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම වූයේ බදුල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි කෘෂිකාර්මික ව්‍යාවසායකයින්ය.

කෘෂි ව්‍යාපාර කළමනාකරණයේදී අලෙවි තොරතුරු භාවිතා කිරීම පිළිබඳ පුහුණුකරුවන්ට දනුමක් ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබිණි.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය ඊ.සී.ඒ. ප්‍රියංකර, පර්යේෂණ නිලධාරීන් වන ප්‍රසන්න විජේසිංහ සහ විරාජිත් කුරුප්පු යන මහත්වරුන් ද මෙම වැඩසටහනට සම්පත් දායකත්වය සැපයූහ.

ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශයෙහි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය එන්.පී.ජී සමන්ත මහතා විසින් මෙම පුහුණු වැඩසටහන සම්බන්ධීකරණය කළේය.




**ගොවි කාන්තා ව්‍යවසායිකාවන් ශක්තිමත් කිරීමේ එක් දින පුහුණු වැඩසටහන**

පිටුව 07




# ගොවිකටයුතු පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මගින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරේ. ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.


**උපදේශකත්වය**

මාලින්ද සෙනෙවිරත්න
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

**අධීක්ෂණය**

එස්.ඒ.සී.යු සේනානායක
ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

**සම්පාදනය හා පිටු සැකසුම**

වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

**ගොවිකටයුතු පුවත්හසුන ප්‍රකාශනය, මුද්‍රණය සහ බෙදා හැරීම**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

දුරකථනය- 0112 696981
ෆැක්ස් - 0112 692423
වෙබ් www.harti.gov.lk

සමාජ මාධ්‍ය ඔස්සේ අප සමග සම්බන්ධ වන්න.

facebook.com/hartilk
twitter.com/harti_lk
instagram.com/harti_lk/




## නව අධ්‍යක්ෂතුමා වැඩ බාර ගනී

**හෙක්ටර්** කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නව අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ලෙස මාලින්ද සෙනෙවිරත්න මහතා පෙබරවාරි 16 දින රාජකාරි ආරම්භ කළේය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ඇමරිකාවේ හාවඩ් සහ කෝනෙල් යන විශ්වවිද්‍යාලවලින් අධ්‍යාපනය ලැබූ එතුමා The Nation පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයෙකු වශයෙන් ද කටයුතු කර තිබේ. සම්මානයට පත් සාහිත්‍යධරයෙකු ද වන මාලින්ද සෙනෙවිරත්න මැතිතුමා වර්තමානයේ නිදහස් මාධ්‍යවේදියෙකු වශයෙන් ද කටයුතු කරයි.

**හෙක්ටර්** කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබ සාධක සංගමයට අයත් පොත් එකතුව විධිමත් පුස්තකාලයක් ලෙස වැඩිදියුණු කර සේවක මණ්ඩලයේ අයිතියට පත් කිරීම අප්‍රේල් 9 දින සිදු විය. අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී මාලින්ද සෙනෙවිරත්න මැතිතුමාගේ සුරතින් එය විවෘත කෙරිණි.

මේ දක්වා සුබ සාධක සංගමයට අයත් ව තිබූ පොත් එකතුවට අලුතින් පොත් විශාල සංඛ්‍යාවක් සහ ක්‍රීඩා උපකරණ රැසක් අධ්‍යක්ෂතුමා විසින් පරිත්‍යාග කළ අතර පුස්තකාලය වැඩි දියුණු කිරීම සඳහා ද එතුමා පූර්ණ අනුග්‍රහය සහ උපදේශකත්වය සැලසීය. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ගීතානි සමරසිංහ මහත්මිය විසින් ද පොත් පරිත්‍යාගයක් සිදු කළාය. නව පොත් එකතුවට නව කතා, පරිවර්තන, මනෝවිද්‍යා කෘති ඇතුළු විවිධ මාදිලියේ පොත් රැසක් ඇතුළත් වෙයි.





අධ්‍යක්ෂතුමා විසින් සුබසාධක සංගමයට කැරම් බෝඩ් පරිත්‍යාග කළ අයුරු



# සත්ත්ව ආහාර හා ආහාර කර්මාන්තය තුළ

# බඩඉරිඟු අගයදාම විශ්ලේෂණය

**සත්ත්ව** ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ බඩඉරිඟු සඳහා විශාල ඉල්ලුමක් නිර්මාණය වී තිබේ. විශේෂයෙන් කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා එය නැතිවම බැරි අමුද්‍රව්‍යයකි. කුකුළු කර්මාන්තයේ දී භාවිතා වන අමුද්‍රව්‍ය යෙදවුම්වලින් දළ වශයෙන් 60% ක් බඩඉරිඟුවලින් සමන්විත වේ.

බඩඉරිඟුවල මිල ගණන් දේශීය හා විදේශීය වශයෙන් ඉහළ යමින් පවතී. ගෝලීය වශයෙන් බඩඉරිඟුවල මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවය සහ බඩඉරිඟු ආනයනය සඳහා පනවා ඇති බද්ද හේතුවෙන් ආනයනික බඩඉරිඟු මිල ඉහළ මට්ටමක පවතී.

බඩඉරිඟු කුකුළු ආහාරවල ප්‍රධාන සංඝටකයක් වන බැවින් කුකුළු ආහාර සඳහා වන පිරිවැය ද වසර ගණනාවක් තිස්සේ ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. කුකුළු ආහාර සඳහා හැරුණු විට ත්‍රිපෝෂ, සමපෝෂ වැනි ධාන්‍ය සීරියල් සකස් කිරීමටත්, පොප්කෝන් සහ තැම්බූ ඉරිඟු වශයෙන් ද බඩඉරිඟු සඳහා වූ ඉල්ලුම පසුගිය වසර කිහිපය තුළ ඉහළ ගොස් තිබේ.

මෙම අධ්‍යයනයේ දී බඩඉරිඟු අලෙවිකරණ පද්ධතිය විශ්ලේෂණය කරනු ලැබේ. බඩඉරිඟු ගබඩා කිරීම සහ සැකසුම් පහසුකම් තක්සේරු කරනු ලබන අතර රට තුළ බඩඉරිඟු වෙළඳාමේ මට්ටම තක්සේරු කෙරේ.



බඩඉරිඟු අගය දාමයෙහි තරගකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා පාර්ශ්වකරුවන් විසින් ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපාර ආකෘති ඇතුළු බලපෑම් සහගත ක්ෂේත්‍ර සහ මැදිහත්වීම් සහ නිර්දේශ සැපයීම සඳහා බඩඉරිඟු අගය දාමය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම මෙම අධ්‍යයනයේ සමස්ත අරමුණයි.

## විශේෂිත අරමුණු

1. බඩඉරිඟු සැපයුම් දාමයේ දැනට පවතින භාවිතාවන් සහ එහි අගය එකතු කළ නිෂ්පාදන සොයා බැලීම.
2. සැපයුම් දාමයේ විවිධ ආර්ථික කාර්යසාධනය (ආන්තිකය, පිරිවැය, ආදායම සහ කාර්යක්ෂමතාවය) විශ්ලේෂණය කිරීම.
3. ඵලදායීතාවය වැඩි කිරීම සඳහා සහ අගය දාමයේ තරගකාරීත්වය වැඩි කිරීම සඳහා අගය දාමයේ ප්‍රධාන ක්‍රියාකාරීන්ගේ ශක්‍යතා, දුර්වලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය කිරීම.
4. මෙරට බඩඉරිඟු අගය දාමයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා සහ ඉහළ තත්ත්වයට ගෙන ඒම සඳහා අවශ්‍ය ප්‍රධාන ප්‍රතිපත්තිමය මූල පිරිම් හඳුනා ගැනීම.

බඩඉරිඟු අගය දාමයේ පවත්නා අභියෝග, අවස්ථාවන් සහ ප්‍රවේශ ස්ථාන පිළිබඳ සවිස්තරාත්මක අදහසක් ලබා ගැනීමට මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ආර්ථික සංවර්ධනය සඳහා විශාල වශයෙන් බඩඉරිඟු නිෂ්පාදනය හා භාවිතය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රයත්නයන් හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනයේ අනාවරණ රූකුලක් සපයනු ඇත.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී රුවිනි විදානපතිරණ ප්‍රමුඛ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ පර්යේෂණ කණ්ඩායමක් විසින් අධ්‍යයනය සිදු කරනු ලබයි. සම පර්යේෂකවරුන් ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන දුමින්ද ප්‍රියදර්ශන, රෝෂිණී රඹුක්වැල්ල සහ ආචාර්ය ඊ.ජී.සී ප්‍රියංකර යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

# පුරන් කුඹුරු නැවත වගා කිරීමේ ප්‍රයත්නයන්හි සාර්ථකත්වය පිළිබඳ සොයා බැලීම



පුරන් කුඹුරු අස්වැද්දීමේ ජාතික වැඩසටහනේ සමාරම්භක උත්සවයට සහභාගී වූ කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා සහ කෘෂිකර්ම රාජ්‍ය ඇමැති ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා ඇතුළු පිරිස ඉහළ ඡායරූපයේ දැක්වේ

**2021** වර්ෂයේ යල කන්නය වෙනුවෙන් ගොවිජන සේවා බල ප්‍රදේශ 320ක පුරන් කුඹුරු අක්කර 28,000ක් අස්වැද්දීමේ ජාතික වැඩසටහන මෙම වර්ෂය ආරම්භයේ දී කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් ආරම්භ කළේය. එමගින් යල කන්නයේ මෙට්‍රික් ටොන් 35,000ක් වී අස්වැන්නට අලුතින් එක් කිරීම අපේක්ෂාවයි.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව 2015/2016 මහකන්නයේ සිට 2019/2020 මහ කන්නය වන විට ශ්‍රී ලංකාවේ සමස්ත පුරන් කුඹුරු ප්‍රමාණය අඩු වීමේ ප්‍රවණතාවක් පසුගිය අවුරුදු පහ තුළ නිරීක්ෂණය වී තිබේ.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව ඇති කුඹුරු ඉඩම් වර්ගීකරණය කර ඇති අතර එයින් A කාණ්ඩය යටතට ගැනෙන පුරන් කුඹුරු නැවත වී වගා කිරීම සඳහා භාවිතා කරයි. මෙහිදී වී වගාව සඳහා සුදුසු වන පරිදි පුරන් කුඹුරුවල සංවර්ධන අවශ්‍යතාවයන් ඉටුකර දෙමින් ඒවා වී වගා කිරීමට යෝග්‍ය වන පරිදි නැවත සකස් කිරීම මෙම පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන්වල මූලික පරමාර්ථය වේ. සෑම වර්ෂයක් පාසාම මෙලෙස දීපව්‍යාප්තව පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා රජය විසින් ප්‍රමාණවත් මුල්‍යමය දායකත්වයක්ද දරනු ලබයි.

ඒ අනුව මෙම පුරන් කුඹුරු නැවත වගා කිරීමේ ප්‍රයත්නවල සාර්ථකත්වය කෙබඳු වේද යන්න මෙන්ම ඒ හරහා ක්‍රියාකාරී කුඹුරු ඉඩම් වපසරියේ මෙන්ම වී අස්වැන්න කෙරෙහි

**මෙම ප්‍රදේශවල බහුලව පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇතත් පසුගිය වර්ෂයන්ගේ දත්ත මගින් අනාවරණය වූ පරිදි අස්වද්දන සහ වපුරන ලද සමස්ත වපසරිය ක්‍රමයෙන් අවම වෙමින් පවතී.**

බලපෑම කෙබඳු ද යන්න පිළිබඳ සොයා බැලීම සඳහා කෘෂි සම්පත් කළමනාකරණ අංශය විසින් 2021 වර්ෂය සඳහා අධ්‍යයනයක් ආරම්භ කර තිබේ.

මේ සඳහා පහත රට තෙත් කලාපයට අයත් කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්ක පහ අධ්‍යයන ප්‍රදේශ ලෙස තෝරා ගෙන තිබේ.

මෙම ප්‍රදේශවල බහුලව පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇතත් පසුගිය වර්ෂයන්ගේ දත්ත මගින් අනාවරණය වූ පරිදි අස්වද්දන සහ වපුරන ලද සමස්ත වපසරිය ක්‍රමයෙන් අවම වෙමින් පවතී.

**ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වන්නේ,**

1 කුඹුරු ඉඩම් පුරන් වීමේ ස්වභාවය සහ එයට බලපාන මූලික හේතුන් අධ්‍යයනය කිරීම

2 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන් හරහා කොතෙක් දුරට එම හේතුන් ආමන්ත්‍රණය කිරීමට හැකිවී ඇත්දැයි සොයා බැලීම සහ

3 පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන් සාර්ථක/අසාර්ථක වීමට බලපාන සාධක හඳුනා ගැනීම

දැනට අධ්‍යයනයේ දත්ත එකතු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

කෘෂි සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරිනි දිනූෂා රත්නායක මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සිදු කෙරෙන මෙම අධ්‍යයනයේ පර්යේෂණ කණ්ඩායම ලෙස අධි පර්යේෂක රේණුකා වීරක්කොඩි, රිෆානා බුහාරි සහ තුෂාරා ධර්මවර්ධන යන පර්යේෂණ නිලධාරී මහත්මීහු කටයුතු කරති.



# කාබනික පොහොර නිෂ්පාදනය වාණිජකරණය කිරීම ගැටලු සහ අවස්ථා

**රසායනික** පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය ආනයනය තහනම් කිරීමට රජය ගත් තීන්දුව අනුව 2021 ඔක්තෝබර් මාසයෙන් ආරම්භ වන මහ කන්නයේ සිට වගා කටයුතු සඳහා කාබනික පොහොර භාවිත කිරීමට ගොවීන්ට සිදුවේ. එබැවින් රටට අවශ්‍ය කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම මේ මොහොතේ අත්‍යවශ්‍ය වේ.

කාබනික පොහොර නිෂ්පාදනය වාණිජකරණය කිරීම සම්බන්ධයෙන් පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය විසින් අධ්‍යයනයක් ආරම්භ කර තිබේ. එහි ප්‍රධාන අරමුණ වන්නේ වාණිජමය කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ඇති බාධාවන් සහ විභවතා හඳුනා ගැනීම සහ වාණිජ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය වැඩි දියුණු කිරීම සඳහා ගත යුතු පියවර නිර්දේශ කිරීම සහ එහි පරිශීලක අංශ හඳුනා ගැනීමයි.

කාබනික පොහොර නිෂ්පාදනය වාණිජකරණය කිරීම සම්බන්ධයෙන් පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය විසින් අධ්‍යයනයක් ආරම්භ කර තිබේ. එහි ප්‍රධාන අරමුණ වන්නේ වාණිජමය කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ඇති බාධාවන් සහ විභවතා හඳුනා ගැනීම සහ වාණිජ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය වැඩි දියුණු කිරීම සඳහා ගත යුතු පියවර නිර්දේශ කිරීම සහ එහි පරිශීලක අංශ හඳුනා ගැනීමයි.

### අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු වන්නේ,

1.ශ්‍රී ලංකාවේ වාණිජ කාබනික පොහොර නිෂ්පාදනයට සම්බන්ධ ප්‍රධාන ක්‍රියාකාරිකයින් හා ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා වටිනාකම් දාම සිතියමක් සකස් කිරීම.

2.කාබනික පොහොර නිෂ්පාදනයේ වාණිජමය පරිමාණයෙන් ඇති ප්‍රධාන ගැටලු හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම සහ වාණිජ කාබනික පොහොරවල පරිශීලක අංශ හඳුනා ගැනීමයි.

වාණිජමය පරිමාණයේ කාබනික පොහොර නිෂ්පාදකයින්, යෙදවුම් සපයන්නන්, වෙළෙඳපොළ අතරමැදියන්, රටේ විවිධ ප්‍රදේශවල පාරිභෝගිකයින් මෙන්ම රජයේ නිලධාරීන් සහ පෞද්ගලික අංශයේ සංවිධාන ඇතුළු අගය දාමයේ සියලුම ක්‍රියාකාරිකයින්ගෙන් දත්ත රැස් කෙරෙනු ඇත. දැනට අධ්‍යයනයේ දත්ත එක්රැස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරිනි නදීෂා ඩයස් මහත්මියගේ සම්බන්ධීකරණයෙන් අධ්‍යයනය සිදු කෙරෙන අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන සිදත් බණ්ඩාර, ශාන්ත හේවගේ සහ තිලනි පද්මජානි යන මහත්ම මහත්මීහු සම පර්යේෂකයින් ලෙස කටයුතු කරති.



# ශ්‍රී ලංකාවේ ප්‍රධාන පලතුරු අපනයන විභවය පිළිබඳ ආර්ථික විශ්ලේෂණය

**දකුණු** ආසියානු කලාපයේ වෙනත් රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාවේ පලතුරු හා එළවළු අංශය රටේ පරිපූර්ණ දේශගුණික තත්ත්වයන් සහ සාරවත් පස හේතුවෙන් තවදුරටත් සංවර්ධනය සඳහා හොඳ හැකියාවක් ඇත.

නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාවේ සමහර නිවර්තන පලතුරු වන අන්නාසි, රඹුටන්, මැන්ගුස්ටින් සහ ෆැෂන් ෆෘට් වැනි නිවර්තන පලතුරු විදේශිකයින් අතර ඉතා ප්‍රචලිත වී ඇත්තේ ඒවායෙහි රසය, සුවඳ සහ වර්ණය වැනි සුවිශේෂී ලක්ෂණ නිසාය.

නිසි වෙළඳපොළ පිළිගැනීමත් සමඟ නැවුම් හා සැකසූ පලතුරුවලින් අපනයන සංවර්ධනය කිරීමට අප රටට හැකියාවක් තිබේ.

එබැවින්, වෙළඳපොළ වෙනස්වීම් සහ විභව වෙළඳපොළ සඳහා මූලික හේතු සොයා බැලීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ සිදු කළ යුතුය.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ පලතුරු අපනයන කර්මාන්තය නංවාලීම සඳහා වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහා වර්තමාන අපනයන තත්ත්වය කාර්යයසාධනය, අපනයන විභවය විශ්ලේෂණය කිරීම සහ අපනයනය සඳහා බලපාන බාධක හඳුනා ගැන ගැනීමයි.

මෙම ව්‍යාපෘතියෙහි සෙසු අරමුණු වන්නේ පලතුරු අපනයන ක්ෂේත්‍රයේ ලක්ෂණ හා ව්‍යුහය පිළිබඳව අධ්‍යයනය කිරීම, අපනයනය සඳහා ඉහළ විභවතාවයක් ඇති පලතුරු බෝග හඳුනා ගැනීම, ප්‍රධාන පලතුරු අපනයනයේ ප්‍රවණතාවය සහ වර්ධන රටාව විශ්ලේෂණය කිරීම හා පලතුරු අපනයන ක්ෂේත්‍ර විභවතා සහ අභියෝග හඳුනා ගැනීමයි.

නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාවේ සමහර නිවර්තන පලතුරු වන අන්නාසි, රඹුටන්, මැන්ගුස්ටින් සහ ෆැෂන් ෆෘට් වැනි නිවර්තන පලතුරු විදේශිකයින් අතර ඉතා ප්‍රචලිත වී ඇත්තේ ඒවායෙහි රසය, සුවඳ සහ වර්ණය වැනි සුවිශේෂී ලක්ෂණ නිසාය.

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ විවිධ පාර්ශවකරුවන්ට පලතුරු අපනයන කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමේ දී සහාය වනු ඇත.

කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ පර්යේෂණ නිලධාරිනී ඒ.කේ.ඒ දිසානායක මහත්මියගේ සම්බන්ධීකරණයෙන් ආරම්භ කර ඇති අධ්‍යයනයේ පර්යේෂණ කණ්ඩායම ලෙස පර්යේෂණ නිලධාරිනියන් වන දිලිනි පෙරේරා, යූ.ඩී.ආර්. උදාරි, ජී. වී. එන්. අයෝමි යන මහත්මීන් කටයුතු කරති.



# ගොවි කාන්තා ව්‍යවසායිකාවන් ශක්තිමත් කිරීමේ එක් දින පුහුණු වැඩසටහන

**කෘෂි ව්‍යවසායිකාවන්ගේ** දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම තුළින් තිරසර කෘෂිකාර්මික ගොවිතැන් ක්‍රම අනුගමනය කරන ශක්තිමත් ගොවි කාන්තා ව්‍යවසායිකාවන් පිරිසක් බිහි කිරීම අරමුණු කරගෙන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය විසින් මෙම පුහුණු වැඩසටහන නිර්මාණය කර තිබේ.

කාන්තාවන්ගේ ප්‍රශස්ත හැකියා උපයෝගී කර ගෙන ගෘහස්ථ මට්ටමෙන් ආදායම් ඉපයීමේ ක්‍රියාවලියකට යොමු කිරීම තුළින් දිළිඳු කම පිටුදැකීම සඳහා කාන්තාවන් බලගැන්වීම පිණිස අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම එහි ප්‍රධාන අරමුණයි.

## වැඩසටහනේ විෂය අන්තර්ගතය

1. බලගැන්වීම හා සමාජ සජීවිකරණය
2. පවුලේ පෝෂණය, සෞඛ්‍ය හා ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි ගෘහණියකගේ කාර්යභාරය
3. පෝෂණීය ගෙවත්ත, සවිමත් ව්‍යවසායිකාවන් ලෙස කාන්තාවන්ගේ කාර්යභාරය
4. නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් ගොවිපොළ හා ගොවිපොළින් බැහැර රැකියා අවස්ථා
5. තිරසාර සංවර්ධනයක් උදෙසා ගොවි කාන්තාවකගේ කාර්යභාරය

රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා බල ප්‍රදේශ 20ක 'සිතමු' ගොවි කාන්තා සංවිධානවල තෝරාගන්නා ලද ව්‍යවසායිකාවන් පුහුණුලාභීන් ලෙස සම්බන්ධ කර ගැනේ.

2021 වර්ෂයේ අප්‍රේල් හා මැයි මාසවල වැඩසටහන් 20ක් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන 20ක පැවැත්වීමට නියමිතය. පුහුණු වැඩසටහනේ ප්‍රාදේශීය සංවිධාන කටයුතු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය මගින් සිදු කරනු ලැබේ.

අධි පර්යේෂක එස්.එම්.ඒ සමරකෝන්, අධි පර්යේෂක එච්.එම්.ජේ.කේ හේරත්, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී පී.සී.ජේ ද සිල්වා, පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු මහතා ඇතුළු පිරිස ආයතනික සම්පත් දායකයින් ලෙස කටයුතු කරති.

බාහිර සම්පත්දායකයන් ලෙස සබරගමුව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

ගොවිකටයුතු පුවත් හසුන
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
වෙළුම 45 2021 පළමු වන හා දෙවන කලාප ISSN 1991-040X



# වාර්ෂික සුහද ක්‍රිකට් ගැටුම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබ සාධක සංගමය විසින් සංවිධානය කළ සුහද ක්‍රිකට් තරගාවලිය මෙවරත් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් හැව්ලොක් ටවුන් හි ලුම්බිණි විද්‍යාලයීය ප්‍රාථමික අංශයේ ක්‍රීඩා පිටියේ දී අප්‍රේල් මස 02වන දින පැවැත්විණි.

ආයතනයේ සේවක මහත්ම මහත්මීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම් හතරක් මෙහිදී තරඟ වැදුණි. සීමිත ඕවර තරගාවලියක් ලෙස පැවති ක්‍රිකට් තරගාවලියේ අවසන් තරගයේ ජයග්‍රහණය තිලකරත්න මහතාගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමට හිමි විය. අනුශූරතාවය හිමි කර ගනු ලැබූ වේ චානක සමන් කුමාර මහතාගේ ගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමයි.



තරගයේ විනිශ්චය කටයුතු සඳහා ලහිරු මෝසෙස් මහතා සහය විය.

මෙම අවස්ථාව සඳහා අධ්‍යක්ෂතුමා ද සහභාගී වූ අතර ආයතනයේ සේවක මණ්ඩලයේ ක්‍රීඩා කෞශල්‍යය ඔප් නංවා ගැනීමට මෙන් ම සේවක මණ්ඩලය අතර සුහදතාව සහ කණ්ඩායම් හැඟීම වර්ධනය සඳහා මෙවැනි අවස්ථා ඉතාමත් වැදගත් බව පිරිස අමතමින් අධ්‍යක්ෂතුමා සඳහන් කළේය. තරගයේ විවිධ අවස්ථාවල ඡායාරූප

